**කටුවන ප්‍රාදේශීය සභාව**
**හම්බන්තොට දිස්ත්‍රික්කය**
**------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
**--------------------------------**

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 අගෝස්තු 31 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
**------------------------------**

මෙම වාර්තාවේ **1.3** ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට කටුවන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
**--------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
**-----------------------**

පහත දැක්වෙන ගිණුම්කරණ අඩුපාඩු විගණනයේදී නිරීක්ෂණය විය.

(අ) ඉකුත් වර්ෂයේදී සභාවට භාරදී තිබූ රු. 6,313,558 ක් වූ ආදාහනාගාර ගොඩනැගිල්ලේ වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සභාවේ මෝටර් ග්‍රේඩරය හා බැකෝ යන්ත්‍රය යොදාගෙන සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර තිබූ රු. 1,877,827 ක් වූ සංවර්ධන වැඩවල වටිනාකම ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් 2018 වර්ෂය තුල දරා තිබූ එකතුව රු. 895,772 ක් වූ වියදම් සඳහා ණයහිමි ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ඈ) 2017 වර්ෂයේ දකුණු පළාත් සංවර්ධන සැලැස්ම යටතේ සහ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ලැබිය යුතුව තිබූ එකතුව රු. 500,000 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ කඩකුලී ආදායම රු. 415,594 ක් අඩුවෙන්ද, සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ එක්වන් මුදල රු. 145,000 ක් වැඩියෙන් ද ගිණුම්ගත කර තිබුණි.

(ඊ) හෙල්ලල කසළ කළමනාකරණ මධ්‍යස්ථානය ඉදිකිරීමේ කර්මාන්තයේ රැඳවුම් මුදල් වෙනුවෙන් ලැබිය යුතු රු. 267,107 ක් සඳහා ණයගැති ප්‍රතිපාදන ඇති කර නොතිබුණි.

**1.3.2 නොසැසඳුණු ගිණුම්**

**-------------------------**

මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් ගිණුම් විෂයයන් 02 ක ශේෂයන් සහ ඊට අදාළ පොත්පත් හා උපලේඛන වල දැක්වෙන ශේෂයන් අතර නිරීක්ෂණය වූ අසමානතාවල එකතුව රු. 10,393,890 ක් විය.

**1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**-----------------------------------**

(අ) ලැබිය යුතු ගිණුම්

------------------

2013 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා අයවිය යුතුව පවතින රු. 3,640,501 ක් වූ කර්මාන්ත ආධාර සහ 2006 වර්ෂයේ සිට අයවිය යුතුව පවතින, 2017 දෙසැම්බර් 31 දිනට රු. 565,242 ක් දක්වා වර්ධනය වී තිබුණු, ලැබිය යුතු වීපී පහන් මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට බේරුම් නොකළ බැරකම් වල මුළු වටිනාකම රු. 17,477,684 ක් වූ අතර, ඉන් රු. 3,543,997 ක් 2013,2014 සහ 2016 වර්ෂවල ඉටුකළ කර්මාන්ත වෙනුවෙන් ගෙවිය යුතු ශේෂයක් විය.

**1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

**------------------------------------------------------**

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 35,202,955 ක් වූ ගිණුම් විෂයයන් 5 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

**1.3.5 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

**------------------------------------------------------------------------**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම (රු.) | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති සංග්‍රහයේ 185 රීතිය | 13,665,436 | සභාවේ ජංගම ගිණුම් 04 ක පැවති අතිරික්ත ශේෂය ආයෝජනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 730,355 | වර්ෂ 02 ක කාලයක් ඉක්මවන ලද කර්මාන්ත 2 කට අදාළ සියයට 10 ක රැඳවුම් මුදල නියාදනය කිරීමට කටයුතු කර නොතිබුණි. |

**1.3.6 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

අයවැයගත ප්‍රතිපාදනය ඉක්මවා දරා තිබුණු රු. 2,437,162 ක ප්‍රාග්ධන වියදම් හා රු. 169,874 ක පුනරාවර්තන වියදම් පියවා ගැනීම සඳහා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති අංක 14 (1) සහ 14 (2) හි සඳහන් විධිවිධාන වලට අනුකූලව කටයුතු කර නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.21,428,629 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.11,702,240 ක් විය.

**2.2** ආදායම් පරිපාලනය

**2.2.1** ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i වරිපනම් හා බදු | 56,400 | 1,044,512 | 1,046,772 | 1,830 | 40,500 | 1,761,091 | 1,759,891 | 4,090 |
| ii කුලී | 14,502,590 | 11,626,932 | 12,615,922 | 1,558,194 | 11,534,000 | 14,633,757 | 14,916,665 | 2,547,184 |
| iii බලපත්‍ර ගාස්තු | 1,528,200 | 1,517,396 | 1,577,896 | 49,650 | 1,468,500 | 1,805,784 | 1,695,634 | 110,150 |
| iv වෙනත් ආදායම් | 16,144,800 | 28,989,608 | 20,042,419 | 32,753,972 | 18,354,000 | 22,206,529 | 19,909,198 | 12,133,008 |
| එකතුව | 32,231,990 | 43,178,448 | 35,283,009 | 34,363,646 | 31,397,000 | 40,407,161 | 38,281,388 | 14,794,432 |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

-----------------------------------

සමාලෝචිත වර්ෂය තුළ බිල්කළ මුළු ආදායම රු. 43,178,448 ක් වූ අතර, රු. 35,283,009 ක් රැස්කර තිබුණි. ඉකුත් වර්ෂය අවසානයට රු. 14,794,432 ක් ව පැවති හිඟ ආදායම සමාලෝචිත වර්ෂය අවසානයට රු. 34,363,646 ක් දක්වා වර්ධනය වී තිබුණි.

### 2.2.3 වරිපනම්

---------

2004 ජුනි 23 දිනැති හා අංක 1346/9 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් දියුණු ගම් ප්‍රදේශ ප්‍රකාශයට පත්කර තිබුණද, එම දේපළ තක්සේරු කර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වගන්තියට අනුකූලව වරිපනම් බදු පනවා අයකර ගැනීමට විගණිත දිනය වූ 2018 පෙබරවාරි 19 දින දක්වාම කටයුතු කර නොතිබුණි.

### 2.2.4 කඩ කුලී

--------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 05 වන ඡේදයට අනුව කඩ කාමර ගිවිසුම් සෑම වසර තුනකට වරක් යාවත්කාලීන කළ යුතු වුවත්, කඩ කාමර 03 ක් සම්බන්ධයෙන් ඊට අනුකූලව කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 හා 2014 වර්ෂ වලදී ලබාදී තිබූ තක්සේරු කුලිය, වසර 02 ක් සඳහා පමණක් බල පැවැත්වෙන බව සඳහන් කර තිබුණද, විගණන දිනය වූ 2018 පෙබරවාරි 19 දින වන විටත් තක්සේරු මුදල් සංශෝධනය කර ගෙන නොතිබුණි.

(ඇ) කිරම වෙළඳ සංකීර්ණයේ නව කඩ කාමර කුලියට ලබාදීම

----------------------------------------------------------------

බදුකරුවන් සමඟ ගිවිසුම්ගතවී උක්ත වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 2017 මාර්තු 30 වන දින බදු දී තිබුණු අතර, තක්සේරු වාර්තාව ලැබෙන තෙක් මසකට රු. 3,500 බැගින් අය කිරීමට මුදල් හා ප්‍රතිපත්ති කමිටුව තීරණය කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

i. උක්ත කඩ කාමර 25 බදු දීමේදී 2010 දෙසැම්බර් 27 දිනැති අංක දපපා/පපාකො/2010/01 දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ 01 වන ඡේදයට අනුකූලව ටෙන්ඩර් ක්‍රියාපටිපාටිය අනුගමනය කර නොතිබුණි.

ii. ඉහත (i) ඡේදයෙහි සඳහන් චක්‍රලේඛයේ 04 වන ඡේදයට අනුව එක්වර හෝ උපරිම මාස හයක් ඇතුළත එක්වන් මුදල අයකර ගත යුතු වුවත්, එකී විධිවිධාන වලට අනුකූල නොවී, එක්වන් මුදල් ගෙවීමට ලබා දී තිබූ වසරක කාලය ද ඉක්මවා තිබූ නමුත්, 2018 මැයි 31 දින වන විටත් රු. 3,268,700 ක් වූ එක්වන් මුදලක් අය වීමට තිබුණි.

iii. ටෙන්ඩර් පටිපාටියෙන් බැහැරව බදු දී තිබුණු මෙම කඩ කාමර වලින් 12 කට අදාළව 2017 දෙසැම්බර් 31 දින වන විට රු. 107,800 ක කුලී මුදලක් මාස 01 ත් 06 ත් අතර කාලයක සිට හිඟව පැවතියද, ඒ සම්බන්ධව ගිවිසුම් ප්‍රකාරව හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඈ) මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර අංක 13 ට අදාළ රු. 103,175 ක හිඟ කඩ කුලිය 2018 මැයි 31 දින වන විටත් අයකරගෙන නොතිබුණු අතර, එක්වත් මුදල් ලෙස රු. 39,000 ක මුදලක් පමණක් අයවී ඇති බව නිරීක්ෂණය විය.

(ඉ) සභාව සතු අනෙකුත් කඩ කාමර වලින් 2017 දෙසැම්බර් 31 දිනට අයවිය යුතුව පැවති රු. 249,864 ක හිඟ කඩ කුලී හා රු. 1,456,667 ක හිඟ එක්වත් මුදල් අයකර ගැනීම සඳහා ගිවිසුම් ප්‍රකාරව හෝ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ඊ) ඉහත (ඇ) (i) හි සඳහන් චක්‍රලේඛයේ 11 වන ඡේදයට අනුව, සභාවේ අනුමැතියකින් තොරව වෙනත් පාර්ශවකරුවෙකු වෙත බදු අයිතිය පැවරීම කිසිසේත්ම නොකළ යුතු වුවත්, සභාවේ කඩ කාමර 14 ක් රු. 6,000 සිට රු. 15,000 දක්වා පරාසයක වූ මාසික කුලියට අතුරු බදුදී ඇති බව 2018 පෙබරවාරි 19 දින සිදු කළ ස්ථානීය පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

**2.2.5 පොළ බදු**

සමාලෝචිත වර්ෂයේදී සභාවට අයත් සතිපොළ නවය ටෙන්ඩර් කර ලබා දීමට කටයුතු කර නොතිබුණි.

**2.2.6 යන්ත්‍රෝපකරණ ආදායම්**

සභාව සතු යන්ත්‍රෝපකරණ කුලියට දීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු. 929,419 ක් හිඟව පැවති අතර, එම අගයෙන් 2013 සිට 2016 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු මුදල රු. 825,585 ක් විය.

**2.2.7 ජල ගාස්තු ආදායම**

සමාලෝචිත වර්ෂය අවසානයට රු.4,327,718 ක් වූ හිඟ ජල ගාස්තු ආදායම අයකර ගැනීමට ඵලදායි ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**2.2.8 උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 2,393,306 ක් හා මුද්දර ගාස්තු රු. 26,032,948 ක් විය.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**--------------------------**

**3.1 කාර්යසාධනය**

**---------------**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ සභාව විසින් ඉටු කළ යුතු මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳ පරීක්ෂාවේදී අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් ප්‍රාග්ධන ආදායම් ලැබෙන මූලාශ්‍ර හඳුනාගෙන නොතිබුණු අතර, ඇස්තමේන්තුගත කර තිබුණු රු. 1,000,000 ක මුදල කුමන සංවර්ධන (ප්‍රාග්ධන) වැඩසටහන් සඳහා යොදවන්නේද යන්න ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය මගින් සහා අරමුදල් යටතේ ඉටු කිරීමට යෝජිතව තිබූ එකතුව රු. 2,015,000 ක් වූ සංවර්ධන යෝජනා ඉටු කර නොතිබුණි.

(ඇ) කර්තව්‍යයන් ඉටු කිරීමේ ප්‍රමාදයන්

----------------------------------------

මාර්ග 04ක ඉදිකිරීම් හා අලුත්වැඩියා කටයුතු වෙනුවෙන් සහ බෝක්කුවක් සකස්කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී එකතුව රු. 650,000 ක් ලැබී තිබුණද, එම කර්මාන්ත ඉටුකිරීම සඳහා ගිවිසුම්ගත වීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) **ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

**--------------------------------**

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

i. 2018 පෙබරවාරි 15 දින වන විටත්, කසල බැහැර කරන භූමිය හා කොම්පෝස්ට් නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.

ii. සමස්ථ බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසල කළමනාකරණ සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

iii. කොම්පෝස්ට් අංගනය සඳහා භාරකරුවකු හෝ මුරකරුවකු සේවයේ යොදවා නොතිබුණු අතර, ආදේශක සේවකයින් දෙදෙනෙකු වරින් වර සේවයේ යොදවා තිබුණි.

iv. ජලය එක් රැස් වන ආකාරයට විවිධ භාජන හා ටයර් අවිධිමත්ව කොම්පෝස්ට් අංගනය තුළ ගොඩගසා තිබුණු අතර, එමගින් මැසි මදුරුවන් ඇතුළු රෝග කාරක කෘමීන් බෝවීම හා රෝග කාරක ව්‍යාප්තිය සිදුවිය හැකි බව නිරීක්ෂණය කෙරේ.

v. 2018 පෙබරවාරි 19 දින දක්වාම, කොම්පෝස්ට් අංගනයෙහි පොලිතීන් තේරීම සඳහා ඉදිකර තිබූ ගොඩනැගිල්ල භාවිතයට ගෙන නොතිබුණු අතර,

කොම්පෝස්ට් නිෂ්පාදනය විධිමත්ව සිදු නොවන බැවින් හලර් යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) තිරසර සංවර්ධන ඉලක්ක

---------------------------

තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයේ තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්ක සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් සභාව විසින් සකස් කර නොතිබුණි.

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

---------------------------------

(අ) වීථි පහන් නඩත්තුව

---------------------

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ 2010 අගෝස්තු 17 දිනැති අංක පීඊ/01/01 දරන චක්‍රලේඛයේ සඳහන් විධිවිධානවලට අනුකූලව, සභා බල ප්‍රදේශය තුළ ස්ථාපනය කර ඇති වීථි පහන්, ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් අනුමත කර ගැනීමට කටයුතු නොකිරීම නිසා සභා අරමුදලින් නඩත්තු කරන වීථි පහන් 1018 න් 217 ක් සඳහා පමණක් ගාස්තු ප්‍රතිපූර්ණය කර තිබුණි .

(ආ) සභාව සතු කැබ් රථයක බඳෙහි වර්ණය මාරු කිරීම

--------------------------------------------------------

කැබ් රථයෙහි බඳෙහි වර්ණය සිල්වර් වර්ණයෙන් රතු වර්ණයට වෙනස් කිරීමේදී මෝටර් වාහන පනත (203 අධිකාරය) 10.2 වගන්තියෙහි දැක්වෙන විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.

## 3.3 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලයේ තනතුරු 02 කට අදාළව, 02 දෙනෙකුගේ අතිරික්තයක් සහ තනතුරු 12 කට අදාළව 21 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි.

(ආ) සභාවේ සේවයේ නියුතු, කාර්යාල කාර්ය සහායකවරියක, වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් 8 දෙනෙකු, ජල කම්කරුවෙකු, සෞඛ්‍ය කම්කරුවෙකු සහ පුස්තකාල සහායකයින් දෙදෙනෙකුට එම තනතුරුවලට අදාළ රාජකාරී නොපවරා වෙනත් රාජකාරී පවරා තිබුණි.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

----------------------------

මිද්දෙණිය සාප්පු සංකීර්ණ ගොඩනැගිල්ලේ දෙවන මහල සහ පළමු මහලේ අංක 21-25 දක්වා කඩ කාමර ගිමන් හලක් පවත්වාගෙන යාම සඳහා බදු දීම

-----------------------------------------------------------------------------------------------------

(අ) යථෝක්ත දේපල බදු දීමට 2017 ඔක්තෝබර් 23 දින ගිවිසුම්ගත වී තිබූ අතර, බදු ගිවිසුමේ 2.1 ඡේදය ප්‍රකාරව ගිවිසුමේ දින සිට මාස 04 ක කාලයක් ඇතුළත ගොඩනැගිල්ල වැඩිදියුණු කිරීමට බදුකරු එකඟවී තිබුණද, 2018 මැයි 04 දින දක්වාම දේපළෙහි නවීකරණ කටයුතු අවසන් කර නොතිබුණු අතර, බදුකරු විසින් කාලය දීර්ඝ කර ගැනීමට ඉල්ලීමක් හෝ කර නොතිබුණි.

(ආ) බදු ගිවිසුමේ 2.2 හා 2.7 කොන්දේසිවලට අනුව මාසිකව බිල්කළ රු. 84,500 න් රු. 46,212 ක් බැගින් ආයෝජනය කරන මුදල හිලව් කිරීමට ඉඩදී තිබුණු අතර, 2017 ඔක්තෝබර් 23 දින සිට දෙසැම්බර් 31 දක්වා කිසිදු වාරිකයක් නොගෙවීම නිසා රු. 94,444 ක බදු කුලී හා දඩ මුදල් හිඟව පැවතුණි.

(ඇ) 2018 ජුනි 13 දින දක්වාම රු. 8,450,000 ක් වූ එක්වන් මුදල් අයකරගෙන නොතිබුණු අතර, එක්වන් මුදල් හා හිඟකුලී සම්බන්ධව සභාව කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 3.5 වත්කම් කළමනාකරණය

--------------------------

### 3.5.1 පවරා නොගත් වත්කම්

------------------------

කටුවන ප්‍රාදේශීය සභාව විසින් භාවිතයට ගනු ලබන පිරිවැය රු. 2,447,025 ක් වූ ගොඩනැගිලි 13 ක, පිරිවැය රු. 245,750 ක් වූ ඉඩම් 6 ක සහ වාහන 03 ක නීත්‍යානුකූල අයිතිය සභාවට පවරා ගැනීමට අදාළ කටයුතු 2018 පෙබරවාරි 19 දින වන විටත් නිමවී නොතිබුණි.

### 3.5.2 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

සභාව සතු වාහන 08 ක් භාවිතයට ගැනීමකින් තොරව වර්ෂ 01 සිට 06 දක්වා කාලයක සිට නිෂ්ක්‍රීයව පැවති අතර, නිත්‍ය යන්ත්‍ර ක්‍රියාකරුවන් තිදෙනෙකු සභාවේ සේවයේ යෙදී සිටියදී බැකෝ යන්ත්‍රය, මෝටර් ග්‍රේඩරය හා තලන රෝල මාස 02 සිට 09 දක්වා කාලයක් ඌන උපයෝජිතව පැවතුණි.

### 3.5.3 භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ ක්‍රියාත්මක කිරීම

---------------------------------------------

භාණ්ඩ ඌනතාවයන් සහ වාහන අළුත්වැඩියාවන් සම්බන්ධව 2016 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවෙන් ලබා දී තිබූ නිර්දේශ 2018 පෙබරවාරි 19 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

3.5.4 වාහන උපයෝජනය

---------------------

(අ) ආදායම් බලපත්‍ර හා රක්ෂණ සහතික ලබා ගැනීම

-----------------------------------------------------

සභාව විසින් භාවිතයට ගනු ලබන වාහන 05 කට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබා ගෙන නොතිබුණු අතර, අත් ට්‍රැක්ටරයක් සහ යතුරු පැදියක් සඳහා රක්ෂණ සහතික ලබා ගෙන නොතිබුණි.

(ආ) ඉන්ධන දහනය පරීක්ෂා කිරීම

---------------------------------

සභාවේ වාහන 11 ක් සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 30/2016 හි දැක්වෙන විධිවිධානවලට අනුකූලව ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබුණි.

3.6 ප්‍රසම්පාදනය

--------------

3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

3.6.2 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

(අ) පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ, ග්‍රාමීය ප්‍රදේශවල මාර්ග කිලෝ මීටර් 1000 ක් සංවර්ධනය කිරීමේ වැඩසටහන 2017 යටතේ සභාව සඳහා රු. 6,000,000 ක ප්‍රතිපාදන අනුමත වී තිබුණ නමුත්, ඒ යටතේ සංවර්ධන යෝජනා සඳහා අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු කර නොතිබුණි.

(ආ) 2013 වර්ෂයට අදාළ රු. 2,995,469 ක් වූ මගනැගුම ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ ඉදි කළ මාර්ග නියමිත ගුණත්වයෙන් තොරවීම නිසා එම ප්‍රතිපාදන සභාවට ලැබී නොතිබුණි.

4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

--------------------------------------

4.1 අයවැය පාලනය

------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර පහත දැක්වෙන පරිදි සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය.

(අ) අයවැය ලේඛනය මගින් වියදම් විෂයයන් 04 ක් සඳහා සලසා තිබූ එකතුව රු. 1,132,000 ක් වූ ප්‍රතිපාදන වර්ෂය අවසානයට සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි.

(ආ) ආදායම් විෂයයන් 02 ක අහිතකර විචලනය රු. 12,204,682 ක් වූ අතර, එම වටිනාකම් සියයට 17 ක් හා සියයට 20 ක් විය.

(ඇ) වියදම් විෂයයන් 03 ක අහිතකර විචලනය රු. 2,607,036 ක් වූ අතර, එම වටිනාකම් සියයට 09 සිට සියයට 33 දක්වා පරාසයක විය.

(ඈ) වියදම් විෂයයන් හතරක ඉතිරිකිරීම් වල එකතුව රු. 10,585,212 ක් වූ අතර, එම වටිනාකම් සියයට 10 සිට 21 දක්වා පරාසයක විය.

(ඉ) ආදායම් විෂයයන් පහක ඇස්තමේන්තුගත ආදායම ඉක්මවා රු. 40,828,725 ක් උපයා ගෙන තිබූ අතර, එම වටිනාකම් සියයට 18 සිට 2700 දක්වා පරාසයක විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

2014 පෙබරවාරි 14 දිනැති අංක දපප/යහ/01/න.ව.ලේ දරන දකුණු පළාත්, පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය අනුව ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා නිලධාරියෙකු පත්කර තිබුණද අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.3 විගණන හා කළමනාකරණ කමිටු**

2009 ජුනි 09 දිනැති අංක DMA/2009 (1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය ප්‍රකාරව කාර්තුවකට 01 බැගින් වාර්ෂිකව විගණන හා කළමනාකරණ කමිටු 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා කමිටු රැස්වීම් 03 ක් පමණක් පවත්වා තිබුණි.

**5. පද්ධති හා පාලන**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| **පද්ධතිය** | **අඩුපාඩුව** |
|---|---|
| (අ) ගිණුම්කරණය | i. ගිණුම් ශේෂ අත්හැරීම්, අඩුවෙන් හා වැඩියෙන් දක්වන ලද අවස්ථා පැවතීම. |
| | ii. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම් සහ අදාළ උපයෝගී ලේඛනවල දැක්වුණු වටිනාකම් අතර වෙනස්කම් පැවතීම. |

| | | |
|---|---|---|
| (ආ) ආදායම් පරිපාලනය | i. | හිඟ ආදායම් අය කර ගැනීමට කටයුතු නොකිරීම. |
| | ii. | නව ආදායම් උත්පාදන මාර්ග හඳුනා නොගැනීම. |
| (ඇ) වත්කම් පාලනය | i. | ඉඩම්, ගොඩනැගිලි හා වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබීම. |
| | ii. | වාහනවල ඉන්ධන දහනය පරීක්ෂා කර නොතිබීම. |
| (ඈ) අයවැය පාලනය | i. | අයවැයගත හා තථ්‍ය ආදායම් හා වියදම් විෂයයන් අතර සැලකිය යුතු විචලනයන් පැවතීම. |
| | ii. | අයවැයගත ඉලක්ක සම්පූර්ණ කර ගැනීම සඳහා ඇගයීම් සහ පසුවිපරම් කටයුතු නොකිරීම. |